**වියළි කලාපීය ජීවනෝපායන් සඳහා සහායවීමේ හා හවුල්වීමේ වැඩ සටහන - 2013 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30**

---

වියළි කලාපීය ජීවනෝපායන් සඳහා සහායවීමේ හා හවුල්වීමේ වැඩ සටහනේ 2013 ජනවාරි 01 සිට සැප්තැම්බර් 30 දක්වා කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (කෘසංජාඅ) අතර 2004 දෙසැම්බර් 15 දින එළඹි අංක 636 එල්කේ දරන ණය ගිවිසුමේ 5.02 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 වැඩ සටහන ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩ සටහන් කාලය

---

වියළි කලාපීය ජීවනෝපායන් සඳහා සහායවීමේ හා හවුල්වීමේ වැඩ සටහනේ ණය ගිවිසුම අනුව, කෘෂිකර්ම අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. අනුරාධපුර, කුරුණෑගල, බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවල කෘෂිකාර්මික නිෂ්පාදන තිරසාරව වැඩිකිරීම සඳහා සම්පත් සජීවීකරණ යාන්ත්‍රණයක් හඳුන්වාදීම හා නිෂ්පාදන සඳහා අගය එකතු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 30.4 ක් වන අතර ඉන් එජඩො මිලියන 22.309 ක් හෙවත් සියයට 73 ක් මූල්‍යයනය කිරීමට කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (කෘසංජාඅ) එකඟවී තිබුණි. මීට අමතරව වියළි කලාපීය ජීවනෝපායන් සඳහා සහායවීමේ හා හවුල්වීමේ වැඩ සටහන් ක්‍රියාත්මක දිස්ත්‍රික්කවල ඉඩම් භුක්තිය සඳහා රු.මිලියන 40 ක් මූල්‍යයනය කිරීමට 2009 අගෝස්තු 31 දිනැති ඉඩම් ප්‍රතිපත්ති ප්‍රදාන අංක 712-එල්කේ යටතේ ආහාර හා කෘෂිකර්ම සංවිධානය (ආකෘසං) සමඟ වෙනත් ගිවිසුමකට එළඹ තිබුණි. වැඩ සටහන එහි කටයුතු 2006 ජනවාරි මාසයේදී ආරම්භ කරන ලද අතර 2013 වර්ෂය අවසානය වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා

ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2.** **විගණන විෂය පථය හා මතය සඳහා පදනම**

**---------------------------------------------**

මාගේ විගණන පරික්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරික්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරික්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු , වත්කම් , වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරික්ෂා කිරීම් ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයන් බලන කල වැඩ සටහන් කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ වැඩසටහනේ මෙහෙයුම්වලට අදාළ පොත්පත් , වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද වැඩසටහන් වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් වැඩසටහනේ ප්‍රගතිය, වැඩසටහනේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම් , ණය සහ ප්‍රදාන යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය සහ ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ වැඩසටහනේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් වැඩ සටහන විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 සැප්තැම්බර් 30 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රීලංමබැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ

(අ) 2013 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් මාස 09 ක කාලපරිච්ඡේදය සඳහා වැඩ සටහන විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 සැප්තැම්බර් 30 දිනට වැඩසටහනේ

ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් මාස 09 ක කාලපරිච්ඡේදය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් වැඩ සටහන විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2013 සැප්තැම්බර් 30 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල නියමකර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහාවූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව සහ,

(ඊ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 4. මූල්‍ය ප්‍රකාශන

--------------

### 4.1 මූල්‍ය කාර්ය සාධනය

---------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත මාස 9 ක කාල පරිච්ඡේදය සඳහා වැඩ සටහනේ වියදම රු.147,363,848 ක් වූ අතර 2013 සැප්තැම්බර් 30 දිනට සමුච්චිත වියදම රු.3,155,948,143 ක් විය. සමාලෝචිත මාස 9 ක කාල පරිච්ඡේදය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2013 සැප්තැම්බර් 30 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **විෂයය** | **2013 සැප්තැම්බර් 30 දිනෙන් අවසන් මාස 9 ක කාල පරිච්ඡේදය සඳහා වියදම** | **2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | **2013 සැප්තැම්බර් 30 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| සිවිල් වැඩ | - | 41,062,332 | 457,133,552 |
| මෝටර් වාහන සහ උපකරණ | 161,980 | 1,656,419 | 78,152,070 |
| කාර්මික සහාය | 21,621,828 | 47,983,129 | 159,782,929 |
| පුහුණු හා වැඩමුළු | 29,404,049 | 110,538,743 | 510,899,096 |
| ප්‍රාථමික වැඩ මුළු | නැත | නැත | 2,409,534 |
| වර්ධක මෙහෙයුම් පිරිවැය | 51,592,374 | 93,944,335 | 545,449,233 |
| සේවා සැපයුම්කරුවන් සමඟ කොන්ත්‍රාත්තු | 15,557,458 | 11,981,094 | 39,778,590 |
| අලෙවිකරණ අරමුදල් වියදම් | 29,026,159 | 183,769,059 | 1,109,393,141 |
| වර්ධක වාසිය | - | 66,900,000 | 252,949,997 |
| එකතුව | 147,363,848 | 557,835,111 | 3,155,948,142 |

## 4.2 අග්‍රිම අරමුදල් ගිණුම

මූලා‍ ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත මාස 9 ක කාල පරිච්ඡේදය තුළ අග්‍රිම අරමුදල් ගිණුමට මුළු ලැබීම් හා ඉන් ආපසු ගැනීම් සහ 2013 සැප්තැම්බර් 30 දිනට එහි ශේෂය පහත පරිදි වේ.

| | **එ.ජ.ඩො.** | **රු.** |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 730,779 | 92,926,490 |
| එකතු කළා :-ඌනපූරණයන් | 623,778 | 79,458,192 |
| විදේශ විනිමය වාසිය | - | 561,330 |
| | 1,354,557 | 172,946,012 |

| | | |
|---|---|---|
| අඩු කළා - ආපසු ගැනීම් | 1,354,557 | 172,946,012 |
| | -------------- | ----------------- |
| 2013 සැප්තැම්බර් 30 දිනට ශේෂය | නැත | නැත |

**5. විගණන නිරීක්ෂණ**

**5.1 ගිණුම්කරණ අඩුපාඩු**

දිළිඳුකම දුරලීමේ අරමුදල හා අලෙවිකරණ අරමුදල යටතේ සිදුකරන ලද සිවිල් වැඩ සහ කාර්යයන්ට අදාළ එකතුව රු.12,899,782 ක් වූ රඳවා ගැනීම් මුදල් නිමකළ වැඩ වටිනාකමට එරෙහිව ලියා හැර තිබුණි. එබැවින් නිමකළ වැඩ වටිනාකම එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

**5.2 භෞතික කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත කාල පරිච්ඡේදය අවසානයට වැඩ සටහනේ සමහර සංරචකයන් සතුටුදායක ප්‍රගතියක් ඉටුකර ගෙන නොතිබුණි. 2013 සැප්තැම්බර් 30 දිනට ඒ පිළිබඳ ඉලක්කයන් හා ඉටුකර ගැනීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | සංරචකය | මූල්‍ය | | භෞතික | |
|---|---|---|---|---|---|
| | | කරන ලද වෙන්කිරීම | තථ්‍ය වියදම | ඉලක්ක | ඉටුකර ගැනීම |
| | | රු.මිලියන | රු.මිලියන | සංඛ්‍යාව | සංඛ්‍යාව |
| (i) | වර්ෂා - පෝෂිත කෘෂිකර්මය | 420 | 403 | 2,800 | 2,505 |
| (ii) | කුඩා වාරිමාර්ග පද්ධති සංවර්ධනය | 540 | 502 | 750 | 708 |
| (iii) | ප්‍රජා යටිතල සංවර්ධනය | | | | |
| | (i) ප්‍රජා මධ්‍යස්ථාන සඳහා ගොඩනැඟිලි ඉදිකිරීම | 810 | 793 | 150 | 120 |
| | (ii) දිළිඳුකම දුරලීමේ වැඩ සටහන | | | 1,600 | 847 |

(iv) අලෙවිකරණ හා සුක්ෂම ව්‍යවසාය
සංවර්ධනය

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | සුක්ෂම ව්‍යවසාය | 355 | 291 | 5,000 | 4,631 |
| (ii) | සෘජු පෙරටු විකුණුම් | | | 20,000 | 11,443 |
| | ගිවිසුම් | | | 300 | 278 |
| (iii) | අලෙවිකරණ පහසුකම් | | | | |

(ආ) කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල විසින් කරන ලද ඉල්ලීම මත පුද්ගලික සමාගමක් විසින් වැඩ සටහන යටතේ සිදුකරන ලද කාර්යයන් පිළිබඳ අධ්‍යයනයක් සිදු කර තිබුණි. කාර්යයන් කිහිපයක් පිළිබඳ අධ්‍යයන වාර්තාවේ ඇතුළත් කරන ලද අදහස් දැක්වීම් පහත පරිදි නැවත ඉදිරිපත් කෙරේ.

**(i) පළතුරු හා එළවළු එකතු කිරීම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම**

**-------------------------------------------------------------**

ගොවීන් සඳහා අලෙවිකරණ පහසුකම් සැපයීමට පළතුරු හා එළවළු එකතු කිරීමේ මධ්‍යස්ථාන සඳහා ගොඩනැඟිලි දෙකක් බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික්කවල ඉදිකර තිබුණි. එම පළතුරු හා එළවළු එකතු කිරීමේ මධ්‍යස්ථාන යටතේ විවිධ සේවා සැපයීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ වෙනම ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම අනුව අදාළ සමාගම විසින් කළ යුතු වූ පහත සඳහන් කාර්යයන් සිදුකර නොතිබුණි.

- ★ පසු අස්වනු තාක්ෂණය පිළිබඳව ගොවීන් පුහුණු කිරීම.
- ★ සුහසාධන අරමුදලක් පිහිටුවීම, එය ගොවි සංවිධාන වලට මාරු කිරිම සහ ගොවින්ගේ සුහසාධනය සඳහා ඒවා යොදා ගැනීම.
- ★ ණය පහසුකම්, යෙදවුම් හා ව්‍යාප්ත සේවා සැපයීම

**(ii) ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය**

**-------------------------------------**

නිරික්ෂණය කරන ලද හා අධ්‍යයන වාර්තාවේ ඉස්මතු කර පෙන්වා දුන් කරුණු පහත පරිදි වේ.

- ★ පානීය ජලයේ වූ කිවුල් ස්වභාවය හේතුවෙන් ළිං සියයට 40 ක් පමණ අත්හැර දමා තිබුණි.

★ කිරි එකතු කිරීම් මධ්‍යස්ථාන හා පානීය ජල ළිං බොහොමයක් පුද්ගලික ඉඩම්වල ඉදිකර තිබුණි. එබැවින් එම ඉඩම් අත්කර ගැනීම් සම්බන්ධයෙන් ආරවුල් පැන නැගී තිබුණි.

**(iii) සුක්ෂම ව්‍යවසාය / ව්‍යවසායකත්ව සංවර්ධන වැඩ සටහන**

-----------------------------------------------------------

මෙම සංරචකය යටතේ, ස්ථාපිත කිරීම සඳහා අපේක්ෂා කරන ලද ව්‍යවසායයන් 2500 කින් ව්‍යවසායන් 1,648 ක් ස්ථාපිත කර තිබූ අතර, එම ව්‍යවසායන්ගෙන් වැඩි ප්‍රමාණයක් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට පෙර සිට පවත්වා ගෙන ආ ඒවා විය. තවද ව්‍යවසායන්ගෙන් සියයට 8 ක් ඒවායේ මෙහෙයුම් ආරම්භ කර නොතිබූ අතර ව්‍යවසායන්ගෙන් සියයට 23 ක් ඒවායේ මෙහෙයුම් නතර කර තිබුණි.

## 6. ප්‍රගති සමාලෝචනය

-------------------------

(අ) වැඩ සටහනේ මුළු වෙන්කිරීම හා දරන ලද මුළු වියදම පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

| විස්තර | එජඩො මිලියන | | රු.මිලියන | | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | ප්‍රතිපාදනය | වියදම | ප්‍රතිපාදනය | වියදම | % |
| කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | | | | | |
| - ණය | 22.479 | 22.276 | 2,942.0 | 2,769 | 94 |
| - ප්‍රදාන | 0.367 | 0.26 | 46 | 34 | 74 |
| ශ්‍රී ලංකා රජයේ දායකය | 1.66 | 1.37 | 191 | 175 | 92 |
| ප්‍රජා දායකය | 1.57 | 1.57 | 181 | 178 | 98 |
| එකතුව | 26.076 | 25.476 | 3,360.0 | 3,156 | 93 |

(ආ) එක් එක් සංරචකය යටතේ වෙන්කිරීම හා වැඩ සටහන අවසානයේදී මුළු වියදම පහත පරිදි වේ.

| | **වෙන්කළ මුදල** | **වැයකළ මුදල** | **අපේක්ෂිත ඉලක්කය** | **භෞතික ඉටුකර ගැනීම** | **උපයෝජනයේ ප්‍රතිශතය** |
|---|---|---|---|---|---|
| | **රු.මිලියන** | **රු.මිලියන** | **සංඛ්‍යාව** | **සංඛ්‍යාව** | % |
| උස්බිම් කෘෂිකර්ම සංවර්ධනය | 420 | 403 | 3,600 | 3,272 | 96 |
| කුඩා වාරිමාර්ග ක්‍රම සංවර්ධනය | 540 | 502 | 750 | 708 | 95 |
| ග්‍රාමීය යටිතල සංවර්ධනය | 810 | 793 | - | - | 98 |
| සුක්ෂ්ම මුල්‍ය පහසුකම් | 277 | 276 | 5,000 | 4,631 | 100 |
| අලෙවිකරණය හා සුක්ෂ්ම ව්‍යවසාය සංවර්ධනය | 355 | 291 | 25,300 | 16,081 | 82 |
| ව්‍යාපෘති කළමනාකරණය | 731 | 726 | - | - | 99 |
| ඉඩම් භුක්ති ආරවුල් පිළිබඳ අධ්‍යයනය | 46 | 35 | - | - | 76 |
| | 3,179 | 3,026 | 34,650 | 24,692 | |